වේ‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

60 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2010 ජූලි
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2010

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II
வணிகக் கல்வியும் கணக்கீடும் I , II
Business and Accounting Studies I , II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව සියලු ම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

---

01. දේශිය පාවාහන් නිපදවන්නන්ගේ ප්‍රමුඛයා වීමේ අපේක්ෂාවෙන් යුතුව හිමාලි හා හුමාලි විසින් "මාලි සහෝදරයෝ" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඉදිරි සැලසුම් අනුව සපත්තු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් හිමාලි රු. 50,000ක් යෙදු අතර අනෙකුත් වියදම් පවත්වාගෙන යාම සඳහා හුමාලි රු. 100,000 ක මුදලක් යෙදවීය.

    දෙදෙනා අතර ව්‍යාපාරය කරගෙන යාම පිළිබඳව ගිවිසුමක් ලිඛිතව පවත්වාගෙන ගිය අතර මහජන බැංකුවේ ජංගම ගිණුමක් රු. 10,000 ක් යොදා අරඹන ලදි. 2001.01.02 දින බැංකු කළමණාකරුත් සමග සාකච්ජා කොට වසර 5ක් සඳහා මාසිකව පොළිය 12% ගෙවීමේ පදනම මත රු. 300,000 ක් ණයක් ලබා ගන්නා ලදි. සපත්තු නිෂ්පාදනය කෘතිම සම් හා සතුන්ගේ සම් යොදා ගෙන සිදුකරන අතර නිෂ්පාදන උපකරණ සඳහා රු. 35,000 ක් වැය කර අදාල උපකරණ 2001.01.07 මිලදී ගන්නා ලදි.

    හිමාලි ට අයත් ගොඩනැගිල්ලක් මාසික කුලිය රු. 10,000 බැගින් ගෙවීමේ පොරොන්දුව පිට ලබා ගත් අතර 2001.01.12 රු. 30,000 ක් යොදා අලුත් වැඩියා කරන ලදි. අලුත් වැඩියා වියදම කුලියෙන් හිලව් කරන ලදි. සෑම මසකම රු. 5,000 බැගින් වැටුපක් හවුල්කරුවන්ට හිමි අතර මාසය අවසාන වී 3 වනදින ගෙවනු ලැබේ.

    2001 මාර්තු 01 දින වනවිට පහත තොරතුරු අනාවරණය විය.

| | | | |
|---|---|---|---|
| ණයට ගැණුම් | 300,000 | ණයහිමියන්ට මුදල් ගෙවීම් | 175,000 |
| මුදලට විකුණුම් | 400,000 | ණයට විකුණුම් | 50,000 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා | 35,000 | ලිපිද්‍රව්‍ය | 5,000 |
| වැටුප් - අත් උදව්කරු | 6,000 | විදුලිය | 2,500 |
| ජලබිල | 250 | අමතර වියදම් | 600 |

බැංකු පොලිය හා වාරිකය සෑම මසකම 31 ගෙවා දමන ලදි. ව්‍යාපාරය දියුණු වූ පසු පෞද්ගලික සමාගමක් බවට පත්කිරීම හවුල්කරුවන්ගේ සැලැස්මයි.

01. මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන ගණයට අයත් වේ ද?
02. ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු පණත හා ආයතනය නම් කරන්න.
03. මෙම හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් කොන්දේසි දෙකක් නම් කරන්න.
04. අනාගතයේ මෙම ව්‍යාපාරය සමාගමක් බවට පත් කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිලි මොනවා ද?
05. සමාගමක් බවට පත් කිරීමේ දී ලබා ගත හැකි වාසි 2ක් සඳහන් කරන්න.
06. ආරම්භක ප්‍රාග්ධනය කොපමණද ?
07. මාලි සහෝදරයෝ ව්‍යාපාරයේ ගිණුම් තැබීම සඳහා පවත්වාගෙන යා යුතු මූලික පොත් 2ක් නම් කරන්න.
08. 2001.01.08 දිනට පහත ගිණුම් සමීකරණය යටතේ අගයන් නිරූපනය කරන්න.

    **උපකරණ** + **මුදල්** + **බැංකු** = **ප්‍රාග්ධනය** + **බැංකු ණය**

09. මාර්තු 01 දිනට ණයගැති හා ණය හිමි ශේෂයන් දක්වන්න.
10. මාර්තු 01 දිනට මුලු ණය පොලිය කොපමණද ?

(ලකුණු 02 x 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය
## (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

02. (i) ශ්‍රී ලංකා මහ බැංකුව දළ ජාතික නිෂ්පාදනය බෙදා දක්වන්නේ කෙසේ ද?
(ii) නිෂ්පාදන ක්‍රියාවලිය ගැලීම් සටහනක් මගින් පෙන්වන්න.
(iii) අලෙවි සැලැස්මක අන්තර්ගත විය යුතු කරුණු 2ක් ලියන්න.
(iv) වෙක්පත් රේඛණය කිරීමේ ප්‍රධාන අරමුණ කුමක් ද?

(ලකුණු 02 x 04 = 08 යි)

03. (i) "වාණිජ බැංකු තම ගනුදෙනු පහසු කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මැනවින් උපයෝගි කොට ගෙන ඇත". ඉහත දැක්වෙන ප්‍රකාශය සනාථ කරන්න.
(ii) රක්ෂණය හා ආරක්ෂණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) පරිවහන මූලිකාංග මොනවා ද?
(iv) ක්‍රමවත් ගබඩාකරණයක් නොමැතිවිට ඇති විය හැකි අනිසි ප්‍රතිවිපාක 4ක් නම් කරන්න.

(ලකුණු 02 x 04 = 08 යි)

## II කොටස - ගිණුම්කරණය
## (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

04. (i) පහත සඳහන් ගනුදෙනු,

**වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්** යන සමීකරණයට ඇතුලත් කරන්න.

1. ප්‍රාග්ධනය යෙදුවා රු. 50,000
2. බැංකු ණය ගෙව්වා රු. 15,000
3. දුරකථන බිල ගෙව්වා රු. 1,500
4. අත්පිට විකුණුම් රු. 18,000 යි.
5. ලී බඩු තොගයක් ගත්තා රු. 20,000 යි.
6. ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 2,500 යි.

(ලකුණු 03 යි)

(ii) ද්විත්ව සටහන් ලියන්න.

1. යන්ත්‍රයක් ගත්තා රු. 25,000 යි
2. ණයට භාණ්ඩ ගත්තා රු. 2,000 යි.
3. පරිගණකයක් මිලට ගත්තා රු. 30,000 යි.
4. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 1,000 ක් ව්‍යාපාරයෙන් ගත්තා.
5. ගෙවල් කුලී ලැබුණා රු. 5,000 යි
6. බැංකු ණයක් ගත්තා රු. 12,000 යි.

(ලකුණු 03 යි)

(iii) 2010 ජුනි 30 දිනට අශෝකමාලාගේ ව්‍යාපාරයේ මුදල් පොතේ පරිදි බැංකු ශේෂය රු. 9,600 ක් විය. එදින ලද බැංකු ප්‍රකාශණයේ ශේෂය මීට අසමාන විය. වෙනසට හේතු මෙසේ සොයා ගන්නා ලදි.

1. තැන්පත් කළ මුත් මෙතෙක් බැංකු ගිණුමට උපලබ්ධි නොවු චෙක්පත් රු. 5,600 යි.
2. බැංකුවට කෙළින්ම බැර කරන ලද රු. 3000 ක චෙක්පත මෙතෙක් මුදල් පොතේ සටහන් වී නොමැත.
3. නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොවු චෙක්පත් රු. 2,000 යි.
4. බැංකු ගාස්තු හා චෙක්පොත් ගාස්තු පිළිවෙලින් රු. 300 ක් හා රු. 400 ක් මුදල් පොතේ සටහන් වී නොමැත.

ඔබ විසින්,

1. 2010 ජුනි 30 දිනට සංශෝධිත මුදල් පොත.
2. 2010 ජුනි 30 දිනට බැංකු සැසදුම් විස්තරය පිළියෙල කරන්න.

(ලකුණු 06 යි)

(ලකුණු 12 යි)

05. 1. පහත දැක්වෙන ගනුදෙනු සඳහා පොදු ජ'නලය පිළියෙල කරන්න.

2010.01.01 දිනට වත්කම්, වගකීම් ගිණුම්වල ශේෂ මෙසේය.

| | |
|---|---|
| ලිබඩු | 5,000 |
| යන්ත්‍ර | 2,000 |
| ණයහිමි | 4,000 |
| මුදල් | 7,200 |

2010.01.12 රු. 50, 000 යන්ත්‍රයක් ණයට ගැනීම.

(ලකුණු 06 යි)

2. හිරන්‍යාගේ ව්‍යාපාරයේ 2010 ජනවාරි මාසයට අදාල සුලු වියදම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2010.01.01 | අග්‍රිමය ලැබුණා | 1,500 |
| 2010.01.04 | ගමන් ගාස්තු | 100 |
| 2010.01.07 | මුද්දර | 150 |
| 2010.01.08 | ගෙනඒමේකුලි | 175 |
| 2010.01.13 | යතුරුලියන කඩදාසි | 200 |
| 2010.01.18 | හිරුණි ට ගෙව්වා | 600 |
| 2010.01.24 | සංග්‍රහ ගාස්තු | 230 |
| 2010.01.29 | මුද්දර හා ලිපිකවර | 115 |

ඉහත සඳහන් තොරතුරු ගමන්, තැපල්, ලිපිද්‍රව්‍ය හා විවිධ යන විශ්ලේෂණ තීරු සහිත සුලු මුදල් පොතක ඇතුලත් කර අග්‍රිමය ප්‍රතිපුරණය කරන්න.

(ලකුණු 06 යි)

(ලකුණු 12 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර විසින් සම්පාදිත යි.